**ඇමෙරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය**
කොළඹ

# ප්‍රවෘත්ති නිවේදනය

මහජන කටයුතු අංශය
දුරකථන: +94 (11) 202-8500 ● ෆැක්ස්: +94 (11) 243-7345
විද්‍යුත් තැපෑල: HattenbachHS@state.gov ● වෙබ්: http://lk.usembassy.gov

## නාවික හවුල්කාරීත්ව සහ ආපදා ප්‍රතිචාර වැඩිදියුණු කරමින් CARAT/MAREX ශ්‍රී ලංකා අභ්‍යාසය සමාප්ත වෙයි

කොළඹ, ශ්‍රී ලංකාව (2023 ජනවාරි 26) – දින අටක් මුළුල්ලේ පුද්ගල වශයෙන් හා සමුද්‍රයේදී පැවැති සම්බන්ධවීම්වලින් පසුව, ශ්‍රී ලංකාවේ සහ එක්සත් ජනපදයේ හමුදාවන් අතරේ සහයෝගීතාවය වැඩිදියුණු කළ Cooperation Afloat Readiness and Training (CARAT)/Marine Exercise (MAREX) Sri Lanka 2023 අභ්‍යාසය ජනවාරි 26 වැනි දින කොළඹ දී අවසන් කරන ලදී.

ජනවාරි 19 සිට 26 වැනි දින දක්වා කාලයේ කොළඹ දී, ත්‍රිකුණාමලයේ හා මුල්ලිකුලම් හි ශ්‍රී ලංකා නාවික හමුදා (SLN) කඳවුරුවල දී, සහ ලකදිව් මුහුදේ දී CARAT/MAREX ශ්‍රී ලංකා අභ්‍යාසය පවත්වන ලදී. මානුෂීය ආධාර සහ ආපදා සහන ලබාදීමේ (HADR) ප්‍රවීණත්වය වර්ධනය කිරීම සහ කලාපයේ පවතින පොදු සමුද්‍රීය ආරක්ෂණ අභියෝග සම්බන්ධයෙන් මෙම අභ්‍යාස හරහා අවධානය යොමුකරන ලදී.

"සෞභාග්‍ය සඳහා සමුදුර මත යැපෙන සුළුබවක් ඇති කිරීමට, සහ සියළුම ස්වෛරී රාජ්‍යයන්ට සාමකාමීව එකිනෙකා සමගින් අන්තර්ක්‍රියා කළහැකි හා නීති-පාදක වූ පිළිවෙළකට සහභාගිවීමට හැකි ලෝකයක් පිළිබඳව පොදු දැක්මක් ඇතිකරගැනීමට සමුද්‍රය සමගින් අපට ඇති මූල සම්බන්ධතාවය හේතු වී තිබෙනවා," එ.ජ. 7වැනි බලඇණියේ උප අණදෙන නිලධාරී, රියර් අද්මිරාල් ජෝකීන් ජේ. මාර්ටිනස් ඩි පිනියොස් මහතා සඳහන් කළේය. " මේ අභ්‍යාසය සහ එය සැබෑ කරගැනීමට උපකාරී වූ සියළුදෙනා, ඒ පොදු දැක්ම යථාර්ථයක් කරගැනීමට එක්සත් ජනපදයේ සහ ශ්‍රී ලංකාවේ කැපවීම සඳහා සාක්ෂි වනවා."

ශ්‍රී ලංකා නාවික හමුදාවේ අක්වෙරළ මුර යාත්‍රා වන SLNS ගජබාහු (P 626) සහ SLNS විජයබාහු (P 627) යාත්‍රා, 13 වැනි සමුද්‍රීය ගවේෂණ ඒකකය (MEU) සහිත සැන් ඇන්ටෝනියෝ පන්තියේ උභයජීවී ප්‍රවාහන නටාකාංගන USS Anchorage (LPD 23) යාත්‍රාව මුහුදේදී හමු විය. මෙම වසරේ අභ්‍යාසයට ජපාන සමුද්‍රීය ස්වයං ආරක්ෂක බලකාය සහ මාලදිවයිනේ ජාතික ආරක්ෂක බලකාය මෙන්ම ශ්‍රී ලංකා ගුවන් හමුදාව ද ඇතුළත් විය.

HADR පුහුණුව සඳහා, එ.ජ. නාවික හමුදාවේ ගොඩබෑමේ යාත්‍රා දෙකකින් භට පිරිස්, බඩුභාණ්ඩ සහ වාහන මුල්ලිකුලම් වෙරළ ප්‍රදේශයට ගොඩබාන ලදී. ඉන් අනතුරුව සිදුකළ අභ්‍යාස හරහා, ආපදා පරිසරයකට සමාන ආකාරයෙන් සැකසූ ආභාසනයක් තුළ එකිනෙක සමගින් සම්බන්ධීකරණය සහ සන්නිවේදනය කරන්නට හවුල්කරුවන්ට ඇති හැකියාව පරීක්ෂා කර බැලීම හා වැඩි දියුණු කිරීම සිදුකරන ලදී.

"මේ අභ්‍යාසය මුළුල්ලේ ඔවුන් දැක්වූ කැපවීම සහ උනන්දුව වෙනුවෙන් සහභාගි වූ හැමදෙනා වෙත මාගේ ස්තුතිය පල කරනවා, එමෙන්ම, අපේක්ෂිත මට්ටමටත් වඩා ඉහළින් මෙම අභ්‍යාසය සම්පූර්ණ කිරීම සඳහා පසුගිය දින කිහිපයේ ඔවුන් දැරූ වෙහෙස සහ පෙන්නුම් කළ වෘත්තීයවේදීත්වය මා සැබවින්ම අගය කරනවා," යනුවෙන් ශ්‍රී ලංකා නාවික හමුදාපති වයිස් අද්මිරාල් ප්‍රියන්ත පෙරේරා මහතා පැවසීය. "අප පොදුවේ උනන්දුව දක්වන කරුණු සම්බන්ධයෙන් ඵලදායී ලෙස ආමන්ත්‍රණය කිරීමට අප විසින් පවත්වාගෙන යන ශක්තිමත් සම්බන්ධතාවය පෝෂණය කිරීම සඳහා ශ්‍රී ලංකාව, එක්සත් ජනපදය, ජපානය සහ මාලදිවයින් අතර ඇති මේ හොඳ සබඳතාවය අනාගතයේ දී ප්‍රගතිශීලී ලෙස ඉදිරියටම යනු ඇතැයි මා ප්‍රාර්ථනා කරනවා."

කණ්ඩායම් උපායමාර්ග, චාරිකා, යාත්‍රාවලට ගොඩවැදීම, සෙවුම් සිදුකිරීම, සහ අල්ලාගැනීම (VBSS), මුහුදේදී නැවත පිරවීමේ ප්‍රවේශ,  හමුදාමය නිරීක්ෂණ, සහ තුවක්කු අභ්‍යාස ඊට අමතරව සිදුකළ අභ්‍යාස විය.  Anchorage නෞකාව මත වූ හෙලිකොප්ටර් යානා VBBS අභ්‍යාස, සහ මුහුදු අදියරට සම්බන්ධ වූ ශ්‍රී ලංකා නවික හමුදාවේ නෞකාවෙන් කාර්යමණ්ඩලය සහ ද්‍රව්‍ය නැව්ගත කිරීම සහ ගොඩබෑම සාර්ථකව සිදු කරන ලදී.

ගොඩබිම් අදියරේ දී සිදුවූ විශේෂ සිදුවීම් අතරට ශ්‍රී ලංකාවේ එ.ජ. තානාපති ජුලී චංග් මහත්මිය ශ්‍රී ලාංකික සහ එක්සත් ජනපද හමුදා සාමාජිකයින් සමගින් කාන්තාවන්, සාමය සහ ආරක්ෂාව පිළිබඳව පැවැත්වූ වටමේස සාකච්ඡාව, දෙරටේ නාවික හමුදා තූර්යවාදක කණ්ඩායම් පැවැත්වූ ප්‍රසිද්ධ ප්‍රසංග, ක්‍රීඩා දිනයක්, සහ ප්‍රජා සේවා ක්‍රියාකාරකම් මාලාවක් ඇතුළත් විය.

" මෙම පස්වන CARAT/MAREX ශ්‍රී ලංකා අභ්‍යාසය අවස්ථාවේ අප දෙරටට දැනුම හුවමාරු කරගැනීමටත්, ඉන් අනතුරුව ප්‍රායෝගිකව ක්‍රියාවේ යෙදවීමටත් හැකියාව ලැබුණා," යනුවෙන් Battalion Landing Team 2/4, 13th MEU අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ජැරඩ් රෙඩින්ජර් මහතා සඳහන් කළේය. "එසේ කිරීමෙන් අපගේ කුසලතා ඔප් නංවාගැනීමටත්, අන්තර් ක්‍රියාකාරීත්වය වැඩිදියුණු කරගැනීමටත්, නිදහස් හා විවෘත ඉන්දු-ශාන්තිකර කලාපයක් සඳහා අපට ඇති පොදු දැක්ම කරා යෑමට එක්ව වැඩ කිරීමටත් අපට හැකි වූවා."

කිමිදීම හා දියයට ඉදිකිරීම්, වෛද්‍ය සහය, සහ සමුද්‍ර බලසීමා පිළිබඳ දැනුවත්භාවය වැනි ගැටළු සම්බන්ධයෙන් එම විෂයයන්හි ප්‍රවීණයින් විසින් පැවැත්වූ දැනුම හුවමාරු ගොඩබිම් අදියරේ පුහුණුවට ඇතුළත් විය. අමතරව සහභාගි වූ එක්සත් ජනපද නිලධාරීන් සහ යාත්‍රා අතරට එ.ජ. 7වැනි බලඇණියේ P-8A පොසයිඩන් යාත්‍රාවක් සහ කාර්යමණ්ඩලය සහ (CTF) 72, CTF 73, CTF 76/3, Destroyer Squadron (DESRON) 7, සහ Amphibious Squadron 7 ඇතුළත් වේ.

"ගොඩබිමේ දී සහ සයුරේ දී CARAT අභ්‍යාසයේ සාර්ථකත්වය 75 වසරක එ.ජ.-ශ්‍රී ලංකා ශ්‍රී ලංකා ද්විපාර්ශවීය සබඳතාවල ගැඹුර සඳහා සාක්ෂියක් වනවා," යනුවෙන් චංග් තානාපතිතුමිය සඳහන් කළාය. "මේ හවුල්කාරීත්වය තවදුරටත් ගොඩනැංවීමටත් කලාපයේ ආරක්ෂාව සහ සෞභාග්‍ය ඉදිරියට ගෙනයාමටත් අප බලාපොරොත්තුවෙන් සිටිනවා."

CARAT/MAREX Sri Lanka යනු කලාපීය ආරක්ෂක සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම, සමුද්‍රීය හවුල්කාරිත්වයන් පවත්වාගෙන යාම සහ ශක්තිමත් කිරීම සහ සමුද්‍රීය අන්තර් ක්‍රියාකාරීත්වය වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාව සහ එක්සත් ජනපදය අතර සැලසුම් කළ ද්විපාර්ශ්වික අභ්‍යාසයකි.

එහි 28 වන වසර තුළ, CARAT අභ්‍යාස මාලාව බහුජාතික අභ්‍යාස වලින් සමන්විත වූ අතර, ඉන්දු- ශාන්තිකර කලාපයේ සාම්ප්‍රදායික සහ සාම්ප්‍රදායික නොවන සමුද්‍ර ආරක්ෂණ අභියෝගවලට ප්‍රතිචාර වශයෙන් එක්ව ක්‍රියා කිරීමටත් එක්සත් ජනපද සහ හවුල්කාර නාවික හමුදාවල හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහාත් නිර්මාණය කර තිබුණි.